# ජාතික අධ්‍යාපන ආයතනය
## සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2012
## ඉල්ලුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

සංඥා හඳුනා ගැනීම, සංඥා භාෂාවෙන් අදහස් හුවමාරු කිරීම, සංඥා භාෂා පරිවර්තනය සහ සංඥා භාෂාවෙන් ඉගැන්වීම පිළිබඳව නිපුණතා ලබා දීම මෙහි අරමුණ වේ. එක් අවුරුදු අර්ධකාලීන සති අන්ත පාඨමාලාවක් වන මෙහි අධ්‍යයන සැසි, ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි, විශේෂ පාසල්වලදීත් පැවැත්වීමට කටයුතු සම්පාදනය කොට ඇත.

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

- රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයකු වීම හෝ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ පාසලක/ආයතනයක /දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්ත ව සිටීම
  හෝ
- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක / ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු
  හෝ
- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු
  හෝ
- ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වීම
  හා
- ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට වයස අවු : 50 ට අඩු වීම

**පාඨමාලා ගාස්තු**

| | |
|---|---|
| අයැදුම්පත් ගාස්තුව | රුː 200/= |
| ලියාපදිංචි ගාස්තුව | රුː 400/= |
| පාඨමාලා ගාස්තුව | රුː 24000/= |

**ඉල්ලුම් කළ යුතු පිළිවෙළ**

- ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම නම, තනතුර, රාජකාරි හා පෞද්ගලික ලිපිනය, උපන් දිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් ඇතුළත් වන සේ තමා විසින් පිළියෙල කර ගත් ඉල්ලුම්පතක්, මහරගම ලංකා බැංකුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **607628** දරන ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකට රුː 200/= ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය සමග **''අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම''** යන ලිපිනයට **2012 මාර්තු මස 10** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (මුදල් ඇණවුම්/තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.) ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ "සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2012 " යනුවෙන් සඳහන් කළ යුතුයි.

**පාඨමාලාවට තෝරා ගැනීම**

- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**මහාචාර්ය ඩබ්. එම්. අබේරත්න බණ්ඩාර**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**2012.02.02**